5

10 ශ්‍රේණිය සිංහල
භාෂාව හා සාහිත්‍යය

Hasitha Hettiarachchi
071-9020298

පිළිතුරු

# ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර

**අවබෝධය**

1. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ජනතාව අතර ජනප්‍රිය වූයේ කවර ගෞරවාන්විත නාමයකින් ද?
2. එතුම ලංකා ජනතාවට ලබා දුන් දායාදය ලෙස සැලකෙන්නේ කුමක් ද?
3. එතුමාගේ චරිතය ඇසුරෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න.
4. එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති කළ වෙනස්කම් තුනක් නම් කරන්න.
5. නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වීමෙන් පසුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී සිදු වූ විශේෂ වෙනස්කම් මොනවා ද?

01 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස

02 මූලික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ම නොමිලයේ ලබා දීමත් එතෙක් ධනය හා වරප්‍රසාද හිමි කොටස්වලට සීමා වී තිබූ උසස් අධ්‍යාපනයේ දොරටු පොදු ජනයාට ද විවෘත කිරීම ය.

03 විෂය කටයුතු මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම්ද සිදු කිරීම.
රට ජාතිය පිළිබඳ සිතා කටයුතු කිරීම.
අවංක බව
අභියෝග හමුවේ නොපැකිළ ඒවා ජය ගැනීමට කටයුතු කිරීම.

04
- ★ සියලු ම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් නොමිලයේ දීම
- ★ ග්‍රාමීය පාසල් රාශියක් බිහි කිරීම
- ★ අධ්‍යාපනය සියලු ගාස්තුවලින් නිදහස් කිරීම
- ★ ඉංග්‍රීසි පාසල්වල මවුබස භාවිතයට අනුබල දීම
- ★ ශාස්ත්‍රීය හා වෘත්තීය විෂය ධාරාවලින් යුත් මධ්‍ය විද්‍යාල රැසක් පිහිටුවීම
- ★ අධ්‍යාපන චින්තාවලිය තුළ ආහාර නිෂ්පාදනයට උපරිම අවධානයක් යෙදීම

05
- ★ සියලු ම පාසල් රජයේ පාලනයට ගැනීම
- ★ අධ්‍යාපනය දියුණු කිරීමට පොත් පත් සහ අනිකුත් පහසුකම් සුලබ කිරීම
- ★ රටේ සමාජ සංස්කෘතික පදනම මෙන් ම වෙනස් වන ලෝක අවශ්‍යතා ද
- ★ අනුව විෂය නිර්දේශ සකස් කිරීම
- ★ නව ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පදවල අර්ථ ලියන්න.

   i. ජාති හිතෛෂී - ජාතිය කෙරෙහි ඇති ආදරය
   ii. පරිවර්තනය - පෙරළිය
   iii. කෞශල්‍යය - හැකියාව
   iv. ශාස්ත්‍රධරත්වය - ශිල්පයේ මනා දක්ෂ බව
   v. ස්වාධීනත්වය - යටත් නොවන බව

2. පහත දී ඇති වචන සඳහා සමාන වචන පාඩමෙන් සොයා ලියන්න.

   i. උත්සාහවන්ත - නිර්භීත
   ii. උතුම් - ශ්‍රේෂ්ඨ
   iii. පිළිවෙත් - ප්‍රතිපත්ති/ සිරිත්
   iv. චරිතයක් - සාමාජිකයෙක්
   v. ද්වාර - දොරටු
   vi. පිළිවෙළ - ක්‍රමය
   vii. දිළිඳු - දුප්පත්

## ප්‍රායෝගික අභ්‍යාස

1. මෙම පාඩම නිශ්ශබ්දව කියවන්න.
2. 'මිල කළ නො හැකි මුතු ඇටය' යන නමින් හැඳින්වෙන නිදහස් අධ්‍යාපන ක්‍රමය පිළිබඳව පාසලේ උදය රැස්වීමේ දී කථාවක් කරන්න.
3. 'නිදහස් අධ්‍යාපනයේ වැදගත්කම' යන මැයෙන් රචනයක් ලියන්න.
4. ලංකාවේ තවත් මෙවැනි ශ්‍රේෂ්ඨ චරිත පිළිබඳ කරුණු එක්රැස් කරන්න.

### ආශ්‍රිත ග්‍රන්ථ


★ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල නොනිමි කර්තව්‍යය (2011)
ජාතික අධ්‍යාපන ආයතනය

★ ලංකාවේ අධ්‍යාපනය - සියවස ප්‍රකාශනය, 2 කාණ්ඩය (1969)

★ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය (1796 - 1965)
කේ. එච්. එම්. සුමතිපාල (පළමු මුද්‍රණය 1993)